සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## බදුල්ල

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, 2021 අවසාන පෙරහුරු පරීක්ෂණය
General Certificate of Education (Advanced Level) Examination , 2021 Final practice test

රසායන විද්‍යාව - I
Chemistry - I

01 S I

13 ශ්‍රේණිය

කාලය පැය දෙකයි.
Time Two Hours

| | | | | | |
|---|---|---|---|---|---|
| සාර්වත්‍ර වායු නියතය | $R$ | $= 8.314 J K^{-1} mol^{-1}$ | ප්ලාන්ක්ගේ නියතය | $h$ | $= 6.626 \times 10^{-34} J s$ |
| ඇවගාඩ්රෝ නියතය | $N_A$ | $=6.022 \times 1023 mol^{-1}$ | ආලෝකයේ ප්‍රවේගය | $c$ | $= 3 \times 10^8 m s^{-1}$ |

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න....

1) ලෝහක බන්ධන ආකෘතිය පිළිබඳ අදහස මුලින්ම ඉදිරිපත් කරන ලද්දේ,
   i. ජේ.ජේ.තොම්සන් හා හෙන්රි බෙකරල්
   ii. ඉයිජින් ගෝල්ඩ්ස්ටයින් සහ හෙන්රි බෙකරල්
   iii. ජේ.ජේ.තොම්සන් හා රොබට් මිලිකන්
   iv. පෝල් කාල්ස් ලුඩ්වික් සහ හෙන්රික් ලෝරන්ස්
   v. රොබට් මිලිකන් සහ ඇල්බට් අයින්ස්ටයින්

2) භූමි අවස්ථාවේ ඇති Cr පරමාණුවක (Cr – 24) උද්දිගංශ ක්වොන්ටම් අංක $\ell = 1$ හා $\ell = 2$ මගින් විස්තර කරන ඉලෙක්ට්‍රෝන සංඛ්‍යා පිළිවෙලින් කුමක් වේද?
   i. 12 හා 4
   ii. 16 හා 4
   iii. 12 හා 5
   iv. 16 හා 5
   v. 6 හා 5

3) එකසර ඉලෙක්ට්‍රෝන වැඩිතම අණුව වනුයේ,
   i. $O_3$
   ii. $SCN^-$
   iii. $CO_2$
   iv. $ClO_2^-$
   v. $NO_2^-$

4) $N_2O_4$ අණුව සඳහා පැවතිය හැකි ස්ථායි ව්‍යුහ සංඛ්‍යාව වනුයේ,




   i. 2
   ii. 3
   iii. 4
   iv. 5
   v. 6

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

5) සංයෝගයේ IUPAC නාම වන්නේ,

$$HOCH_2-\underset{Br}{\overset{CH_3}{C}}-\underset{O}{\overset{\|}{C}}-CH=CH_2$$

i. 2 – bromo – 1 – hydroxy – 2 – methylpent – 4 – en – 3 - one
ii. 2 – bromo – 1 – hydroxy – 2 – methyl – 4 – pentene - 3 - one
iii. 4 – bromo – 5 – hydroxy – 4 – methylpent – 1 – en - 3 - one
iv. 4 – bromo – 5 – hydroxy – 4 - methyl – 1 – pentene - 3 - one
v. 4 – bromo – 4 – methyl - 5 - hydroxypent – 1 – en - 3 - one

6) P , Na , Mg , N හා Al යන මූලද්‍රව්‍ය වල පළමුවන අයනීකරණ ශක්තිය වැඩිවන පිළිවෙළ වන්නේ,
i. Al < Na < Mg < P < N
ii. Na < Al < Mg < P < N
iii. Na < Mg < Al < N < P
iv. N < Na < Al < Mg < P
v. Na < Al < Mg < N < P

7)

$$2C_2H_{6(g)} + 7O_{2(g)} \xrightarrow{\Delta H^\theta_f = -3120 KJmol^{-1}} 4CO_{2(g)} + 6H_2O_{(l)}$$

$$2H_{2(g)} + O_2 \xrightarrow{\Delta H^\theta_f = -572 KJmol^{-1}} 2H_2O_{(l)}$$

$$C_{(s)} + O_{2(g)} \xrightarrow{\Delta H^\theta_f = -394 KJmol^{-1}} CO_{2(g)}$$

ඉහත දී ඇති දත්ත භාවිතයෙන්,

$2C_{(s)} + 3H_{2(g)} \longrightarrow C_2H_{6(g)}$ යන ප්‍රතික්‍රියාව සඳහා එන්තැල්පි විපර්යාසය $\Delta H^\theta$ වනුයේ,

i. +25 KJ
ii. -58 KJ
iii. +86 KJ
iv. -86 KJ
v. -52 KJ

8) පළමුපෙළ ප්‍රතික්‍රියාවක අර්ධ ජීව කාලය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ,
i. උෂ්ණත්වයෙන් ස්වායත්ත වේ
ii. ආරම්භක ප්‍රතික්‍රියක සාන්ද්‍රණයෙන් ස්වායත්ත වේ
iii. උෂ්ණත්වය වැඩිවන විට අර්ධ ජීව කාලය අඩුවේ
iv. K නියතය වැඩිවන විට t ½ වැඩිවේ
v. පළමු පෙළ ප්‍රතික්‍රියාවක අර්ධ ජීවය කාලය 0.693/2K මගින් දෙනු ලබයි

9) පහත ප්‍රතික්‍රියාවේ ඵලය වන්නේ,




1. 


2. 


3. 


4. 


5. 

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

10) $25C^0$ දී ආම්ලික $ZnSO_4$ හා $CuSO_4$ අඩංගු ද්‍රාවනයක සාන්ද්‍රණය 0.1mol $dm^{-3}$ බැගින් වේ. ද්‍රාවනය $H_2S$ වලින් සංතෘප්ත කරන විට සිදුවිය හැක්කේ,

i. කිසිදු අවක්ෂේපයක් ඇතිනොවේ
ii. පළමුව ZnS අවක්ෂේප වේ
iii. ZnS හා CuS එකවර අවක්ෂේප වේ
iv. පළමුව ZnS අවක්ෂේප වී පසුව CuS අවක්ෂේප වේ
v. පළමුව CuS අවක්ෂේප වේ

11) 0.1mol$dm^{-1}$ $(NH_4)_2SO_4$ 20.0$cm^3$ ක් 0.20mol $dm^{-3}$ $BaCl_2$ 25.0$cm^3$ ක් සමඟ මිශ්‍ර කරන ලදී. සෑදෙන $BaSO_4$ අවක්ෂේපයේ ස්කන්ධය හා ඉතිරි වන ප්‍රතික්‍රියකයේ මවුල ගණන වන්නේ, ( Ba – 137 , S – 32 , O – 16 )

i. 1.165 g , $2 \times 10^{-3}$ mol
ii. 0.233 g , $3 \times 10^{-3}$ mol
iii. 0.466 g , $3 \times 10^{-3}$ mol
iv. 0.466 g , $2 \times 10^{-3}$ mol
v. 1.165 g , $3 \times 10^{-3}$ mol

12) $NOCl$ , $NH_3$ , $F_3C-NC$ , $F_3C-CN$ , $NO_2Cl$ සහ $NH_4^+$ යන ප්‍රභේදවල නයිට්‍රජන් පරමාණු වල විද්‍යුත් සෘණතාවය වැඩිවන ආකාරය නිවැරදිව දැක්වෙන්නේ පහත කුමන ප්‍රතිචාරයෙන්ද?

i. $NH_3 < NOCl < F_3C-CN < NH_4^+ < NO_2Cl < F_3N-NC$
ii. $NH_4^+ < NO_2Cl < F_3C-CN < NH_3 < NOCl < F_3C-NC$
iii. $NH_3 < NH_4^+ < NOCl < NO_2Cl < F_3C-CN < F_3C-NC$
iv. $NH_3 < NH_4^+ < NO_2Cl < NOCl < F_3C-CN < F_3C-NC$
v. $NH_3 < NH_4^+ < NOCl < NO_2Cl < F_3C-NC < F_3C-CN$

13) $Cr_2O_3$ සමඟ Al පිරියම් කිරීමෙන් Cr ලැබේ.
$Al_2O_{3(s)}$ සම්මත උත්පාදන එන්තැල්පිය –1672 $KJmol^{-1}$ වන අතර $Cr_2O_3$ හි සම්මත උත්පාදන එන්තැල්පිය - 724$KJmol^{-1}$ වේ. $Cr_2O_3$ හා Al අතර ප්‍රතික්‍රියාවේදී Cr 1040g ක් නිෂ්පාදනය කිරීමේදී සිදුවන එන්තැල්පි විපර්යාසය වන්නේ ($KJmol^{-1}$) (Cr = 52) ,

i. -948
ii. +9480
iii. -9480
iv. +948
v. -4740

14) X නම් සංශුද්ධ ද්‍රව්‍යක කලාප සටහන පහත දී ඇත. ද්‍රව්‍යයේ ත්‍රික ලක්ෂයේදී උෂ්ණත්වය $590C^0$ වන අතර පීඩනය 50 atm ක් වේ. $500C^0$ දී 58 atm සිට පීඩනය අඩුකර ගෙන යාමේදී සිදුවිය හැකි කලාප සංක්‍රමණය වනුයේ,




i. විලයනය
ii. ඝනීභවනය
iii. ඌර්ධවපාතනය
iv. වාෂ්පීකරණය
v. ස්ඵටිකීකරණය

15) $CO_{(g)} + H_2O_{(g)} \leftrightharpoons CO_{2(g)} + H_{2(g)}$ යන නියත උෂ්ණත්වයක පවතින සමතුලිත ප්‍රතික්‍රියාව සලකන්න. $CO_2$ සාන්ද්‍රණය වැඩිකර ගැනීමට කුමක් සිදුකළ යුතුද?

i. උත්ප්‍රේරකයක් එක් කිරීමේදී
ii. $H_{2(g)}$ ස්වල්පයක් එකතු කිරීම
iii. නිශ්ක්‍රීය වායුවක් එකතු කිරීම
iv. $CO_{(g)}$ ස්වල්පයක් එකතු කිරීම
v. බඳුනේ පරිමාව අඩුකිරීම

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

16) ෆීනෝල් සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය වන්නේ,

i. ඇල්කොහොල වලට වඩා ෆීනෝල් ආම්ලික වේ
ii. ෆීනෝල් නියුක්ලියෝෆිලික ආදේශ ප්‍රතික්‍රියා වලට සහභාගී වේ
iii. බෙන්සීන් වලට වඩා පහසුවෙන් ෆීනෝල ඉලෙක්ට්‍රොෆිලික ආදේශ ප්‍රතික්‍රියා වලට නැඹුරු වේ
iv. ෆීනෝල ෆීඩ්ල්ක්‍රාෆ්ට් ඇල්කිල්කරණයට සහභාගි නොවේ
v. තනුක $HNO_3$ හමුවේ ෆීනොල් නයිට්‍රෝනකරනයට භාජනය වේ

17) පහත ද ඇති ප්‍රතික්‍රියාව සලකන්න

$$3\,W_{(g)} + X_{(g)} \rightleftharpoons 2Y_{(g)} + Z_{(g)}$$

W හා X හි සම මවුල ප්‍රමාණ එකතු කරමින් පරිමාව නියත බඳුනක ප්‍රතික්‍රියාව ආරම්භ කරන ලද නම් , සමතුලිතතාවයේදී පහත කුමක් නිවැරදි වේද?

i. [Y] = [Z]
ii. [Z] > [Y]
iii. [W] = [X]
iv. [X] > [W]
v. [X] < [W]

18) T නම් උෂ්ණත්වයේදී,

$$N_{2(g)} + O_{2(g)} \rightleftharpoons 2NO_{(g)}\,; \quad Kc = 2 \times 10^{-25}$$

$$2NO_{(g)} + O_{2(g)} \rightleftharpoons 2NO_{2(g)}\,; \; Kc = 6.4 \times 10^{9}$$

$2NO_{2(g)} \rightleftharpoons N_{2(g)} + 2O_{2(g)}$ යන ප්‍රතික්‍රියාව සඳහා Kc හි අගය වන්නේ,

i. $3.2 \times 10^{-34}$
ii. $7.8 \times 10^{14}$
iii. $12.8 \times 10^{-16}$
iv. $3.1 \times 10^{-36}$
v. ගණනය සඳහා දත්ත ප්‍රමාණවත් නොවේ

19) පහත දී ඇති කෝෂයේ විද්‍යුත් ගාමක බලය කොපමණද?

$M_{(s)} \mid M^{+2}_{(aq)} \mid\mid N^{+3}_{(aq)} \mid N_{(s)}$

$E^{\theta}\ M^{+2}/M = -\,0.72V$ $\quad$ $E^{\theta}\ N^{+3}/N = +\,0.28V$

i. 1.00 V
ii. 0.44 V
iii. -1.00 V
iv. -0.44 V
v. 2.04 V

20) භෂ්මිකව වැඩිවන පිළිවෙල වන්නේ,

K→  L→  M → $CH_3CH_2NH_2$ N→ $CH_3CH_2NH{-}CH_3$ O → $NH_3$

i. K<L<M<O<N
ii. L<K<M<O<N
iii. K<L<O<M<N
iv. L<K<O<M<N
v. L<K<O<N<M

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

21) 0.01 mol $dm^{-3}$ KOH ද්‍රාවණයකින් 50.00$cm^3$ පරිමාවක් 0.11mol $dm^{-3}$ HA දුබල අම්ල ද්‍රාවණයේ 50.00$cm^3$ පරිමාවකට එකතු කරන ලදී. අවසාන මිශ්‍රණයේ pH අගය 6.2 බව සොයා ගන්නා ලදී. අම්ලයේ විඝටන නියතය $K_a$ නම් පහත කුමන පිළිතුර මගින් $pK_a$ එහි අගය දැක්වේද?

i. 5.2
ii. 6.0
iii. 6.2
iv. 7.0
v. 7.2

22) ක්ෂාර හා ක්ෂාරීය පාංශු ලෝහ සම්බන්ධයෙන් මින් කුමන වගන්තිය අසත්‍ය වේද?

i. ක්ෂාර ලෝහ අතරින් $N_2$ වායුව සමඟ රත් කිරීමේදී ප්‍රතික්‍රියා කරන්නේ $Li_{(s)}$ පමණි.
ii. වැඩිපුර ඔක්සිජන් සමඟ ප්‍රතික්‍රියා කිරීමේදී සෝඩියම් එහි පෙරොක්සයිඩය සෑදුවද, සුපර් ඔක්සයිඩ නොසාදයි
iii. වැඩිපුර ඔක්සිජන් සමඟ ප්‍රතික්‍රියා කිරීමේදී සුපර් ඔක්සයිඩය සාදන්නේ ක්ෂාර ලෝහ අතරින් K , Rb , Cs යන ලෝහ පමණි
iv. ක්ෂාරීය පාංශු ලෝහ කිසිවක් සුපර් ඔක්සයිඩය නොසාදයි
v. කැල්සියම් ඔක්සිජන් සමඟ ඔක්සයිඩය සාදන අතර වැඩිපුර ඔක්සිජන් සමඟ ප්‍රතික්‍රියා කර පෙරොක්සයිඩය සාදයි

23) 298 Kදී දුබල භෂ්මයක් වන B හි සාන්ද්‍රණය C mol $dm^{-3}$ වන අතර විඝටන නියතය $K_b$ වේ. 298 K මෙම ද්‍රාවණයේ pH අගය කුමන ප්‍රකාශය මගින් ලබා දෙයිද?

i. $pH = PK_b - \frac{1}{2} \lg C$
ii. $pH = PK_b + \frac{1}{2} \lg C$
iii. $POH = \frac{1}{2} \lg C - PK_b$
iv. $pH = PK_w + \frac{1}{2} \lg C - \frac{1}{2} PK_b$
v. $pH = PK_w + \frac{1}{2} \lg C + \frac{1}{2} PK_b$

24) පරිමාව 1$dm^3$ ක් වන බඳුනක් තුළ $N_2O_4$ 1mol ක් දෘඪ භාජනයක තැබූ විට පහත සඳහන් සමජාතීය සමතුලිතතාවට එළඹේ.

$N_2O_{4(g)} \rightleftharpoons 2NO_{2(g)}$ යන ප්‍රතික්‍රියා මිශ්‍රණයේ සංයුතියත් සමඟ $\Delta G$ විචලනය ප්‍රස්තාරයේ දක්වා ඇත. දී ඇති වගන්ති වලින් සත්‍ය ප්‍රකාශය වනුයේ,

i. ගිබ්ස් ශක්ති වෙනස -2.3 KJ වේ
ii. $N_2O_{4(g)} \rightarrow NO_2$ බවට පත්වීම ස්වයං සිද්ධව සිදුවේ
iii. සමතුලිත අවස්ථාවේදී $NO_2$ මවුල 0.2 ක් පමණි
iv. $K_c$ හි අගය 0.2 mol $dm^{-3}$ වේ
v. අඩු උෂ්ණත්ව වලදී ප්‍රතික්‍රියාව ස්වයං සිද්ධව සිදුවේ




25) ඒක භාෂ්මික දුබල අම්ලයක් වන HX හි 25$C^0$ දී විඝටන නියතය $1.5 \times 10^{-5}$ mol$dm^{-3}$ වේ. 0.1mol $dm^{-3}$ වන HX හා 0.1 mol $dm^{-3}$ KOH අතර අනුමාපනයේදී යොදා ගත හැකි දර්ශකයක් වන්නේ,

i. පිනෝප්තලින් ( 8.3 10 )
ii. බ්‍රෝමොතයිමෝල් බ්ලූ ( 6.0 – 7.6 )
iii. මෙතිල් රෙඩ් ( 4.4 – 6.2 )
iv. බ්‍රෝමොෆීනෝල් බ්ලූ (3.0 – 4.6 )
v. මෙතිල් ඔරේන්ජ් ( 3.1 – 4.4 )

26) නිෂ්ක්‍රිය ඉලෙක්ට්‍රෝඩ යොදා 25$C^0$ දී හා 1 atm තත්ව යටතේදී තනුක $H_2SO_4$ ද්‍රාවනයක් විද්‍යුත් විච්ඡේදනය කරන ලදී. 1.5 A ක ධාරාවක් පැය 5ක් තුළ යවන ලද්දේ නම්, කැතෝඩය අසලින් නිකුත් වන වායු පරිමාව වනුයේ, (F = 96485)

i. 1.734 $dm^3$
ii. 3.47 $dm^3$
iii. 1.734 $m^{-3}$
iv. 3.47 $m^{-3}$
v. 6.94 $dm^3$

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

27) යම් උෂ්ණත්වයකදී $CCl_4$ හා ජලය අතර $I_2$ හි ව්‍යාප්ති සංගුණකය 25 ක් වේ. ජලය 500cm$^3$ තුළ $I_2$ 0.5 g ක් අඩංගු වී ඇති ද්‍රාවනයකින්, $CCl_4$ 100cm$^3$ ක් එකවර යොදා නිස්සාරණය කර ගත හැකි $I_2$ ස්කන්ධය වනුයේ,

i. 0.417 g
ii. 0.280 g
iii. 0.182 g
iv. 0.033 g
v. 0.032 g

28) සමතුලිතතා නියත පිළිවෙලින් K1 , K2 හා K3 වන පහත සමතුලිතතා සලකන්න

$$A_{(g)} + B_{(g)} \rightleftharpoons C_{(g)}$$
$$C_{(g)} + A_{(g)} \rightleftharpoons D_{(g)}$$
$$2A_{(g)} + B_{(g)} \rightleftharpoons D_{(g)}$$

සමතුලිත නියත තුන අතර සම්බන්ධය දැක්වෙන්නේ පහත කුමන සමීකරණයෙන්ද?

i. $K_3 = K_1 \times K_2$
ii. $K_3 = \sqrt{K_1K_2}$
iii. $K_3 = \frac{1}{K_1 + K_2}$
iv. $K_3 = K_1 \times K_2$
v. $K_3 = K_1 + K_2$

29) පහත ප්‍රකාශ වලින් අසත්‍ය වගන්තිය වන්නේ,

i. $H_2O_2$ ඔක්සිකාරකයක් මෙන්ම ඔක්සිහාරකයක් ලෙසද ක්‍රියා කරයි
ii. වායුමය අවස්ථාවේදී ඇලුමිනියම් ක්ලෝරයිඩ හි ඇලුමිනියම් වටා හැඩය චතුස්තලීය වේ
iii. ඇලුමිනියම් ජලීය ඇමෝනියා සමඟ අවක්ෂේපයක් සාදන අතර එය වැඩිපුර ඇමෝනියා තුළ දියවේ.
iv. Be වල ඉලෙක්ට්‍රෝඩ ලබා ගැනීමේදී ශක්තිය ධන වේ
v. $Ncl_3$ ජලය සමඟ අම්ලයක් හා භස්මයක් ලබා දෙයි

30) P , Q , R සඳහා ව්‍යුහ පිළිවෙලින් වන්නේ,




i. $CH_3CH_2CH{=}CHCH_2OH$ , $CH_3CH_2CH{=}CHCH_2OH$ , $CH_3CH_2CH_2CHBrCH_2Br$
ii. $CH_3CH_2CH{=}CHCH_2OH$ , $CH_3CH_2CH{=}CHCH_2OH$ , $CH_3CH_2CHBrCH_2CH_2Br$
iii. $CH_3CH_2CH{=}CHCH_2OH$ , $CH_3CH_2CH{=}CHCH_2OH$ , $CH_3CH_2CH{=}CHCH_2Br$
iv. $CH_3CH_2CH_2CH_2CH_2OH$ , $CH_3CH_2CH_2CH_2CH_2OH$ , $CH_3CH_2CH_2CH_2CH_2Br$
v. $CH_3CH_2CH{=}CHCH_2OH$ , $CH_3CH_2CH_2CH_2CH_2OH$ , $CH_3CH_2CH_2CH_2CH_2Br$

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

- අංක **31** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (*a*), (*b*), (*c*) සහ (*d*) යන ප්‍රතිචාර හතර අතුරෙන්, එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි ය. නිවැරදි ප්‍රතිචාරය/ප්‍රතිචාර කවරේ දැ'යි තෝරා ගන්න.

(*a*) සහ (*b*) පමණක් නිවැරදි නම් (1) මත ද
(*b*) සහ (*c*) පමණක් නිවැරදි නම් (2) මත ද
(*c*) සහ (*d*) පමණක් නිවැරදි නම් (3) මත ද
(*d*) සහ (*a*) පමණක් නිවැරදි නම් (4) මත ද
වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් (5) මත ද

උත්තර පත්‍රයෙහි දැක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න.

**ඉහත උපදෙස් සම්පිණ්ඩනය**

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| (*a*) සහ (*b*) පමණක් නිවැරදියි | (*b*) සහ (*c*) පමණක් නිවැරදියි | (*c*) සහ (*d*) පමණක් නිවැරදියි | (*d*) සහ (*a*) පමණක් නිවැරදියි | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදියි |

31) 3d ආවර්තයේ මූලද්‍රව්‍ය පිළිබඳ කුමන ප්‍රකාශය / ප්‍රකාශය නිවැරදි වේද?

a) 3d ආවර්තයේ මූලද්‍රව්‍ය වලින් Sc සහ Zn ආන්තරික මූලද්‍රව්‍ය ලෙස සැලකේ
b) 3d මූලද්‍රව්‍ය සියල්ල විචල්‍ය ඔක්සිකරණ අවස්ථා දක්වයි
c) 3d මූලද්‍රව්‍ය සිසිල් ජලය සමඟ ප්‍රතික්‍රියා නොකරයි
d) 3d මූලද්‍රව්‍ය වල පළමුවන අයනීකරණ ශක්තිය එම ආවර්තයේම 4s මූලද්‍රව්‍ය වල පළමුවන අයනීකරණ ශක්තියට වඩා වැඩි වේ

32) කාබනික සංයෝග සම්බන්ධයෙන් සත්‍ය වන්නේ,
a) වයිනයිල් ක්ලෝරයිඩ් නියුක්ලියෝෆිලික ආදේශ ප්‍රතික්‍රියාවලට සහභාගි වේ
b) ජලය සමඟ හයිඩ්‍රජන් බන්ධන සාදන සියළුම මධ්‍යසාර ජලයේ හොඳින් දිය වේ
c) ඒමයිඩ $NaOH_{(aq)}$ සමඟ රත්කළ විට $NH_3$ පිට කරයි
d) ෆීනෝල $Na_2CO_3$ සමඟ $CO_2$ පිට කරයි

33) සංවෘත පද්ධතියක් තුල සිදුවන පහත ප්‍රතික්‍රියාව සලකන්න

$$CO_{(g)} + 2H_{2(g)} \rightleftharpoons CH_3OH_{(g)} \quad \Delta H = -93.0 KJ\ mol^{-1}$$

මෙම ප්‍රතික්‍රියාව පිළිබඳ පහත කුමන වගන්තිය / වගන්ති නිවැරදි වේද?

a) නියත උෂ්ණත්වයේදී පීඩනය වැඩි කිරීමෙන් සෑදෙන ඵල ප්‍රමාණය වැඩිවේ
b) නියත පීඩනයේදී උෂ්ණත්වය වැඩි කිරීමෙන් , සෑදෙන ඵල ප්‍රමාණය අඩුවේ
c) උත්ප්‍රේරකයක් භාවිතා කිරීමෙන් සෑදෙන ඵල ප්‍රමාණය වැඩිවේ
d) උත්ප්‍රේරකයක් භාවිතා කිරීමෙන් පසු ප්‍රතික්‍රියාවේ සක්‍රියන ශක්තිය වැඩිවේ

34) X සංයෝග සම්බන්ධයෙන් සත්‍ය වන්නේ,




a) X , HBr සමඟ ප්‍රතික්‍රියාවෙන් ලැබෙන ඵලය ප්‍රතිරූප අවයව සමාවයවිකතාව පෙන්වයි
b) X ප්‍රතිරූප අවයව සමවයවිකතාව පෙන්වයි
c) X පාරත්‍රිමාන සමාවයවිකතාව පෙන්වයි
d) X හයිඩ්‍රජනීකරනයෙන් ලැබෙන ඵල ප්‍රතිරූප අවයව සමාවයවිකතාව පෙන්වයි

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

35) නියත උෂ්ණත්වයකදී A හා B නම් වාෂ්පශීලී ද්‍රව 2 ක සම මවුල ප්‍රමාණ මිශ්‍ර කල විට පරිපූර්ණ ද්‍රාවනයක් ලැබේ. සමතුලිත අවස්ථාවේදී ද්‍රාවනය තුළ ඇති A වල මවුල භාගය $X_A$ වන අතර B හි මවුල භාගය $X_B$ වේ. වාෂ්ප කලාපයේ A හි මවුල භාගය $Y_A$ වන අතර B හි මවුල භාගය $Y_B$ වේ. A හි සංතෘප්ත වාෂ්ප පීඩනය $2 \times 10^3$ pa වන අතර B හි සංතෘප්ත වාෂ්ප පීඩනය $5 \times 10^6$ pa වේ. ද්‍රාවනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

a) වාෂ්ප කලාපයේ පීඩනය $7 \times 10^3$ pa වේ
b) $X_A + Y_A = 1$
c) $Y_B > Y_A$
d) $X_A > X_B$

36) බහු අවයවික පිළිබඳ පහත කුමක් නිවැරදි වේද?

a) පොලිස්ටයිරීන් තාප ස්ථාපන බහුඅවයවයකි
b) නයිලෝන් 6,6 සාදාගනුයේ 1,6 - diaminohexane හා ethane dioc acid බහු අවයවීකරණයෙනි
c) යූරියා ෆෝමැල්ඩිහයිඩ් හා බේක්ලයිට් යන දෙකම තාප සුවිකාර්ය වේ
d) පොලිස්ටයිරීන් සාදාගනු ලබන්නේ, ස්ටයිරීන් ඒක අවයව ආකලන බහු අවයවීකරණයෙනි

37) පහත කුමන ප්‍රාශය ප්‍රකාශ අසත්‍ය වේද?

a) 2 වන කාණ්ඩයේ නයිට්‍රේට් වල තාපස්ථායිතාව කාණ්ඩයේ ඔස්සේ පහළට යත් ම වැඩිවේ
b) d ගොනුවේ නොවන අවර්තයක් ඔස්සේ වමේ සිට දකුණට යත් ම හයිඩ්‍රොක්සයිඩ වල ආම්ලික ගුණ අඩුවේ
c) 15 කාණ්ඩයේ හේලයිඩවල ජල විච්ඡේදන හැකියාව කාණ්ඩය ඔස්සේ පහළට වැඩිවේ
d) දෙවන කාණ්ඩයේ හයිඩ්‍රොක්සයිඩ වල ජල ද්‍රාව්‍යතාවය කාණ්ඩය ඔස්සේ පහළට වැඩිවේ

38) කිසියම් ප්‍රතික්‍රියාවක් පහත දී ඇති පියවර දෙකෙන් සිදුවේ. එම පියවරවල් දෙකෙහි සීඝ්‍රතා නියත පිළිවෙලින් $K_1$ හා $K_2$ වේ.

i. $NO_{2(g)} + NO2(g) \xrightarrow{K_1} NO_{3(g)} + NO_{(g)}$ (සෙමෙන්) -------- I
ii. $NO_{3(g)} + CO_{(g)} \xrightarrow{K_2} NO_{2(g)} + CO_{2(g)}$ (වේගෙන්) --------- II

සිදුවන සමස්ථ ප්‍රතික්‍රියාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වනුයේ,

a) $NO_{2(g)}$ අනුබද්ධයෙන් පෙළ 2 වේ
b) CO අනුබද්ධයෙන් පෙළ ශූන්‍ය වේ
c) K1 > K2 වේ
d) වේග නිර්ණ පියවර II වේ

39) වායු පිළිබඳ චාලක අණුක වාදය සම්බන්ධයෙන් සත්‍ය ප්‍රකාශ / ප්‍රකාශය වනුයේ,

a) පරිපූර්ණ වායු අණුවක චාලක ශක්තිය නියත උෂ්ණත්වයේදී නියත වේ
b) උෂ්ණත්වය වැඩිවන විට වායුවක සසම්භාවී වේගය වැඩිවේ
c) උෂ්ණත්වය වැඩිකරන විට අණුවක මධ්‍යයන වේගය වැඩිවේ
d) උෂ්ණත්වය නියතවිට වායු අණුවල මධ්‍යයන වේගය වායුවේ මවුලික ස්කන්ධයට ප්‍රතිලෝමව සමානුපාතික වේ

40) අසත්‍ය වගන්ති වනුයේ

a) කාබනික අපද්‍රව්‍ය ඔක්සිකරණය සඳහා රසායනිකව අවශ්‍ය $O_2$ ප්‍රමාණය BOD නමින් හැඳින්වේ
b) $NO_3^-$ ජල දූෂකයක් නොවේ
c) ජලාශවලට මිනිස් මළ ද්‍රව්‍ය එකතු වීම මගින් එහි BOD අගය වැඩිවේ
d) සන්නායකතාව ජලයේ ගුණාත්මක බව මනින පරාමිතියකි

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

- අංක **41** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා ප්‍රකාශ දෙක බැගින් ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශ යුගලයට **හොඳින්ම** ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන පරිදි (1), (2), (3), (4) සහ (5) යන ප්‍රතිචාරවලින් කවර ප්‍රතිචාරය දැ'යි තෝරා උත්තර පත්‍රයෙහි උචිත ලෙස ලකුණු කරන්න.

| ප්‍රතිචාරය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය වේ. | සත්‍ය වන අතර, පළමුවැනි ප්‍රකාශය නිවැරදි ව පහදා දෙයි. |
| (2) | සත්‍ය වේ. | සත්‍ය වන නමුත් පළමුවැනි ප්‍රකාශය නිවැරදි ව පහදා නොදෙයි. |
| (3) | සත්‍ය වේ. | අසත්‍ය වේ. |
| (4) | අසත්‍ය වේ. | සත්‍ය වේ. |
| (5) | අසත්‍ය වේ. | අසත්‍ය වේ. |

| පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|
| 41) $Cr(OH)_3$ සාන්ද්‍ර $NaOH$ තුල මෙන් ම සාන්ද්‍ර $HCl$ තුලදී දියවේ | $Cr(OH)_3$ උභයගුණී ලක්ෂණ ඇති හයිඩ්‍රොක්සයිඩයකි |
| 42) ධාරා ඌෂ්මකය තුල $CO$ සෑදීම ඉහළ උෂ්ණත්ව වලදී සිදුවේ | ඉහළ උෂ්ණත්ව වලදී $\Delta G < O$ වේ |
| 43) සොල්වේ ක්‍රමයෙන් $Na_2CO_3$ නිෂ්පාදනයේදී පළමු අටළු තුල දී බ්‍රයින් ද්‍රාවනය $CO_2$ මඟින් සංතෘප්ත කෙරේ | කාමර උෂ්ණත්වයේදී $CO_2$ වල ද්‍රාව්‍යතාව ඉහළය |
| 44) පරිපූර්ණ වායුවක සියළුම අණු එකම වේගයෙන් ගමන් කරයි | පරිපූර්ණ වායුවක අන්තර් අණුක බල නොමැත |
| 45) $CH_3CH = CH\ CH_2\ Br$, $NaOH$ සමඟ පහසුවෙන් ප්‍රතික්‍රියා කරයි | $CH_3\ CH = CH\ CH_2\ Br$ ප්‍රාථමික ඇල්කයිල් හේලයිඩයකි |
| 46) $CH_3\ C\equiv CH$ හා $C_6H_5NH_3Cl$ වෙන්කර හඳුනාගැනීමට $NH_3$ / $AgNO_3$ භාවිතා කළ හැක | සංයෝග දෙකම $NH_3$ / $Ag\ NO_3$ සමඟ සුදු අවක්ෂේප ලබා දේ |
| 47) එකම උෂ්ණත්වයේදී එකම සීඝ්‍රතාවයෙන් සිදුවන වෙනස් ප්‍රතික්‍රියා දෙකක සක්‍රීය ශක්තිය සමාන විය යුතුය | ප්‍රතික්‍රියාවක සීඝ්‍රතාවය සක්‍රියන ශක්තියට අනුලෝමව සමානුපාතික වේ |
| 48) $CH_3-\overset{\overset{O}{\|}}{C}-CH_3$ හි තාපාංකය $CH_3CH_2CHO$ හි තාපාංකයට වඩා වැඩිය | $CH_3-\overset{\overset{O}{\|}}{C}-CH_3$ හි ද්විධ්‍රැව ඝූර්ණය $CH_3CH_2CHO$ ට වඩා වැඩිය |
| 49) උෂ්ණත්වය වැඩිකරන විට ජලයේ අයනික ගුණිතය, $K_w$ අඩුවේ | ජලයේ විඝටනය වීම තාප දායක වේ |
| 50) අම්ල වැසි සඳහා $SO_3$ දායක වේ | $SO_3$ ජලයේ ද්‍රාවනය වී $H_2SO_4$ සාදයි |

සියලුම හිමිකම් ඇවිරිණි /
All Rights Reserved ]

# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## බදුල්ල

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2021 අවසාන පෙරහුරු පරීක්ෂණය
General Certificate of Education (Advanced Level) Examination 2021 Final practice test

රසායන විද්‍යාව - II
Chemistry - II

01 | S | I

13 ශ්‍රේණිය

කාලය - පැය තුනයි

## A කොටස - ව්‍යුහගත රචනා

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1)

a) පහත සඳහන් ප්‍රශ්නවලට තිත් ඉරි මත පිළිතුරු ලියන්න

i. $Mg^{+2}$ , $Al^{3+}$ , $Li^{+}$ යන අයන අතුරෙන් කුඩා ම අයනික අරය ඇත්තේ,

..........................................................................................................................................

ii. N , O , S යන මූලද්‍රව්‍ය අතුරෙන් වැඩි ම විද්‍යුත් සෘණතා අගයක් ඇත්තේ,

..........................................................................................................................................

iii. NaCl , KF හා KCl යන අයනික සංයෝග අතරින්, වැඩි ම සහ සංයුජ ලක්ෂණ ඇත්තේ කුමකට ද?

..........................................................................................................................................

iv. NO , $NO_3^-$ , $NO_2^-$ අතරින් කුඩා ම බන්ධන දිග ඇත්තේ කුමකට ද?

..........................................................................................................................................

v. $AlCl_3$ , $MgCl_2$ , $SiCl_4$ අතරින් ජල විච්ඡේදන හැකියාව වැඩි ම වන්නේ,

..........................................................................................................................................

vi. $CF_4$ $CCl_4$ , $CH_4$ අතරින් කාබන් පරමාණුව මත විද්‍යුත් සෘණතාවය වැඩිම වන්නේ,

..........................................................................................................................................

b)

i. $HN_3$ අණුවෙහි සැකිල්ල පහත දැක්වේ

H – N – N – N

එහි N – N බන්ධන දිග ආසන්න වශයෙන් සමාන වන ලුවිස් ව්‍යුහය අඳින්න

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

ii. $CN_2CH_3$ අණුව සඳහා වඩාත් පිළිගත හැකි ස්ථායී තිත් - ඉරි ව්‍යුහය පහත දක්වා ඇත. මෙම අණුව සඳහා තවත් අස්ථායී ලුවිස් තිත් - ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) දෙකක් අඳින්න



iii. පහත සඳහන් ලුවිස් තිත් - ඉරි ව්‍යුහය සහ ලේබල් කරන ලද සැකිල්ල පදනම් කරගෙන වගුව සම්පූර්ණ කරන්න





| | $C_1$ | $C_2$ | $C_3$ | $C_4$ | N |
|---|---|---|---|---|---|
| පරමාණුව වටා VSEPR යුගල් සංඛ්‍යාව | | | | | |
| පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | | | | | |
| පරමාණුව වටා හැඩය | | | | | |
| පරමාණුවේ මුහුම්කරණය | | | | | |
| පරමාණුව මත ඔක්සිකරණ අංකය | | | | | |

- කොටස් (iv) සිට (vii) ඉහත කොටසෙහි දෙන ලද ලුවිස් තිත් - ඉරි ව්‍යුහය මත පදනම් වේ. පරමාණු ලේබල් කිරීම කොටසෙහි ආකාරයට ම වේ.

iv. පහත දැක්වෙන පරමාණු දෙක අතර σ බන්ධන සහභාගී වන පරමාණුක මුහුම් කාක්ෂික හඳුනා ගන්න

I. $C_1$ හා $C_2$ $C_1$ ………………………. $C_2$……………………….

II. $C_2$ හා $C_3$ $C_2$ ………………………. $C_3$……………………….

III. $C_3$ හා $C_4$ $C_3$………………………. $C_4$……………………….

IV. $C_4$ හා N $C_4$………………………. N……………………….

V. $C_2$ හා O $C_2$………………………. O……………………….

VI. $C_2$ හා H $C_2$………………………. H……………………….

[සියලුම හිමිකම් ඇවිරිණි ]
[All Rights Reserved ]

v. පහත දැක්වෙන පරමාණු දෙක අතර π බන්ධන සෑදීමට සහභාගී වන පරමාණුක කාක්ෂික හඳුනාගන්න

I. $C_2$ හා O  $C_2$........................  O........................

II. $C_4$ හා N  $C_4$........................  N........................

vi. $C_1$ , $C_2$ , $C_4$ වටා ආසන්න බන්ධන කෝණ සඳහන් කරන්න

$C_1$ ........................  $C_2$........................  $C_4$ ........................

vii. $C_1$ , C2හා $C_4$ පරමාණු විද්‍යුත් සෘණතාව වැඩි වන පිළිවෙළට සකසන්න

........................ < ........................ < ........................

c) පහත සඳහන් තොරතුරු සලකන්න

I. P සහ Q පරමාණු සංයෝජනය වී σ බන්ධනයක් සහිත විෂමජාතීය ද්විපරමාණුක PQ අණුව සාදයි. මෙය P – Q ලෙස නිරූපණය කරනු ලැබේ.

II. P වල විද්‍යුත් සෘණතාවය Q වල එම අගයට වඩා අඩුයි ($X_P < X_Q$)

III. X - පරමාණුවේ විද්‍යුත් සෘණතාව

ඉහත තොරතුරු පදනම් කර ගෙන පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

i. P හා Q අතර බන්ධන වර්ගය කුමක්ද?

..........................................................................................................

ii. PQ අණුවෙ හි භාගික ආරෝපණය ($\delta$ + හා $\delta$-) ස්ථානගත වී ඇත්තේ කෙසේදැයි පෙන්නුම් කරන්න

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

iii. PQ අණුවේ ද්විධ්‍රැව ඝූර්ණය ( $\mu$ ) ගණනය කිරීමට භාවිතා කරන සමීකරණය ලියා දිශාව පෙන්නුම් කරන්න

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

iv. $H_2$වල අන්තර් න්‍යෂ්ටික දුර $(d - H - H) = 74$ pm

$Cl_2$වල අන්තර් න්‍යෂ්ටික දුර $(d\ Cl - Cl) = 198$ pm

ද්වි ධ්‍රැවයේ සම්ප්‍රයුක්ත ආරෝපණය $(\delta) = 160 \times 10^{-19}$ C

I. H – Cl හි ද්වි ධ්‍රැව ඝූර්ණය ගණනය කරන්න

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

2)

a) X හා Y යනු S හා P ගොනුවලට අයත් මූලද්‍රව්‍ය දෙක කි. X වාතයේ දහනය කළ විට A හා B භාෂ්මික සංයෝග දෙකක් ලබා දේ.

Y සිසිල් තනුක NaOH සමඟ ප්‍රතික්‍රියා කළ විට C හා D නම් සංයෝග දෙකක් ද ජලය ද ලබා දේ. C විරංජන ගුණ දක්වන අතර, C ඉහළ උෂ්ණත්ව වලදී ද්විධාකරණයට ලක් වේ. B ජලයේ දිය වීමෙන් E නම් වායුවක් නිදහස් කරන අතර , E නම් වායුව Y හයිඩ්‍රයිඩයක් සමඟ සුදු පැහැති දූමාරයක් ලබා දේ.

i. X හා Y මූලද්‍රව්‍ය හඳුනා ගන්න

X - ..............................................................................................................

Y - ..............................................................................................................

ii. A – E දක්වා හඳුනා ගන්න

A..............................................................................................................

B..............................................................................................................

C..............................................................................................................

D..............................................................................................................

E..............................................................................................................

a. A හා B ජලය සමඟ ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

b. Y තනුක NaOH සමඟ ප්‍රතික්‍රියාව සඳහා තුලිත සමීකරණය ලියන්න

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

c. C ද්විධාකරණය සඳහා ප්‍රතික්‍රියාව සඳහන් කරන්න

..............................................................................................................

..............................................................................................................

d. C හි IUPAC නාමය සඳහන් කරන්න

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

e. E වායුව විවිධ අනුපාත වලින් Y හි වායුව සමඟ ප්‍රතික්‍රියා කරවූ විට ලැබෙන ඵල සඳහන් කර තුලිත සමීකරණ ලියන්න

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

b) පරීක්ෂණ නල 5 ක A, B, C , D, E යන ජලීය ද්‍රාවණ අඩංගු වේ. එම ද්‍රාවණ $Na_2S_2O_3$, NaI , $Na NO_2$ , $NH_4SCN$ හා $Na_2 SO_3$ වේ. (පිළිවෙලින් නොවේ) එක් එක් ද්‍රාවණය හඳුනා ගැනීමට කරන ලද පරීක්ෂණ හා නිරීක්ෂණ පහත දක්වා ඇත.

| | පරීක්ෂණය | නිරීක්ෂණය |
|---|---|---|
| A | i. Al කුඩු හා NaOH සමඟ රත් කිරීම<br>ii. පිටවන වායුව HCl වාෂ්පයෙන් පරීක්ෂා කිරීම | අවර්ණ වායුවක් පිටවේ<br>සුදු පැහැ දුමාරයක් පිටවේ |
| B | ද්‍රාවණයට $FeCl_3$ එක් කිරීම | තද රතු පැහැ ද්‍රාවණයක් ලැබේ |
| C | i. ජලීය ද්‍රාවණයට $BaCl_2$ ද්‍රාවණයක් එක් කිරීම<br>ii. වෙන් කර ගන්නා ලද අවක්ෂේපයට තනුක HCl එකතු කිරීම | සුදු පැහැ අවක්ෂේපයක් ලබා දේ අවක්ෂේපය දියවේ |
| D | ජලීය ද්‍රාවණයට $(CH_3COO)_2Pb$ ස්වල්පයක් එක් කිරීම | සුදු පැහැ අවක්ෂේපයක් ලබා දේ<br>අවක්ෂේපය රත් කිරීමේදී කළු පැහැ වේ |
| E | i. ජලීය ද්‍රාවණයට සා. $HNO_3$ හා $AgNO_3$ එක් කිරීම<br>ii. සාන්ද්‍ර ඇමෝනියා එක් කිරීම | කහ පැහැයට ගුරු අවක්ෂේපයක් ලැබේ<br>අවක්ෂේපය ද්‍රාවණය නොවේ |

A සිට E දක්වා හඳුනා ගන්න

අවක්ෂේප

A.......................................................................................................................................

B.......................................................................................................................................

C.......................................................................................................................................

D.......................................................................................................................................

E.......................................................................................................................................

i. අවක්ෂේප සෑදීමට තුලිත රසායනික සමීකරණ ලියන්න

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

3)

a) $27^0C$ දී දෙන ලද තාල රසායනික දත්ත කිහිපයක් පහත දැක්වේ.

| ද්‍රව්‍යය | $CS_{2\,(g)}$ | $H_{2\,(g)}$ | $CH_{4\,(g)}$ | $H_2 S_{(g)}$ |
|---|---|---|---|---|
| $\Delta H_f^\theta$ / K Jmol$^{-1}$ | 88 | 0 | -75 | -20 |
| $S^\theta$ / J mol K$^{-1}$ | 151 | 130.6 | +86 | 122 |

පහත ප්‍රතික්‍රියාව සලකන්න

$CS_{2\,(g)} + 4H_{2\,(g)} \rightleftharpoons CH_{4\,(g)} + 2H_2S_{\,(g)}$ යන ප්‍රතික්‍රියාව සලකන්න

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

i. $27^0C$ දී ඉහත ප්‍රතික්‍රියාවට $\Delta H^0$ අදාල අගය සොයන්න

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

ii. $27^0C$ දී එම ප්‍රතික්‍රියාව අදාල $\Delta S^0$ අගය සොයන්න

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

iii. එමගින් පහත ප්‍රතික්‍රියාව සඳහා $\Delta G^0$ අගය සොයන්න

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

iv. ඉහත ප්‍රතික්‍රියාව සඳහා $\Delta G$ 650 $^0C$ දී සොයන්න. ඔබ කරන උපකල්පන දක්වන්න

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

v. $27^0C$ දී හා 650 $^0C$ දී ප්‍රතික්‍රියාවේ ස්වයංසිද්ධතාව සාකච්ඡා කරන්න

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

b) පහත දී ඇති $\Delta G^0$ අගය සලකන්න

| ද්‍රව්‍යය | $\Delta G_f^0 K\ J\ mol^{-1}$ |
|---|---|
| $KClO_{3(s)}$ | - 391.2 |
| $KCl_{(s)}$ | - 436.7 |
| $O_{2(g)}$ | 0 |

$$2KClO_{3(s)} \longrightarrow 2KCl_{(s)} + O_{2(g)}$$

ඉහත පද්ධතියේ $\Delta G^0$ අගය සොයන්න. මෙය $O_2$ වායු ලබා ගැනීමට යොදා ගත හැකිද දක්වන්න

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

c)

I. ව්‍යාප්ති සංගුණකය යන්න හඳුන්වා දෙන්න

..................................................................................................................................

..................................................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි ]
All Rights Reserved ]

II. $CCl_4$හා $H_2O$ අතර $I_2$ ව්‍යාප්ත වේ. මෙහි $CCl_4$ ස්තරයේ $10cm^3$සමඟ ප්‍රතික්‍රියා වීමට $0.5 \, mol \, dm^{-3}$ $Na_2S_2O_3$ $26.9 \, cm^3$ වැය විය. ජලීය ස්තරයේ $20cm^3$සමඟ ප්‍රතික්‍රියා වීමට $0.01 \, mol \, dm^{-3}$ $Na_2S_2O_3$ $31.5cm^3$ක් වැය විය. $CCl_4$ හා ජලය අතර $I_2$හි ව්‍යාප්ත සංගුණකය සොයන්න

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

4)

A.

A , B , C , D හා E යනු ඒක ආදේශික ඇරොමැටික සංයෝගය වේ. එහි අණුක සූත්‍රය $C_9H_{12}O$ වන මධ්‍යසාර 05කි. A හා Dපමණක් ප්‍රතිරූප සමාවයවිකතා නොපෙන්වන අතර B , C , E ප්‍රතිරූප අවයව සමාවයවිකතාය පෙන්වයි. A සංයෝගය P.CC මඟින් ඔක්සිකරණය වී P සාදන අතර D P.C.C මඟින් ඔක්සිකරණය නොවේ.B , C , E සංයෝග P.C.C මඟින් ඔක්සිකරණය වී Q , R , S පිළිවලින් ලබාදෙන අතර S ෆේලිං ද්‍රාවනය සමඟ ප්‍රතික්‍රියා කරයි. Q , R ප්‍රතික්‍රියාවක් නොදක්වයි. Q , $C_2H_5MgBr$ සමඟ ප්‍රතික්‍රියා කරවා ජල විච්ඡේදනයක් ලැබෙන ඵලය තල ධ්‍රැවිත ආලෝකය හමුවේ භ්‍රමණය වේ.

I. A , B , C , D , E හි ව්‍යුහ අඳින්න

| A | B | C |
|---|---|---|
| | | |

| D | E |
|---|---|
| | |

II. P, Q , R , S හි ව්‍යුහ අඳින්න

| P | Q | R | S |
|---|---|---|---|
| | | | |

III. A හා D වෙන්කර හඳුනා ගැනීමට පරීක්ෂාවක් හා නිරීක්ෂණ ඉදිරිපත් කරන්න

.................................................................................................................................

.................................................................................................................................

